00128

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පූර්ව පාසල් අධ්‍යාපනය පිළිබඳ උසස් සහතික පත්‍ර වැඩ සටහන

අවසාන පරීක්ෂණය - 2018

**EPA2517/EPE2517/ESC2217-** මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ සමාජ සංස්කෘතික පර්යාලෝකය

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2018.12.28 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. රැකියාව සඳහා ශ්‍රී ලාංකික මව්වරුන් විදේශගත වීම ඔවුන්ගේ දරුවන් කෙරෙහි ඇතිකරන බලපෑම් පහක් (05) දක්වන්න.

02. “විස්තෘත පවුල” හා “න්‍යෂ්ටික පවුල” යන්නෙහි වෙනස පැහැදිලි කරන්න.

03. දරුවන්ගේ කියවීමේ කුසලතා වර්ධනය කිරීමෙහි ලා දෙමව්පියන් විසින් අනුගමනය කළයුතු පියවර පහක් (05) ලැයිස්තුගත කරන්න.

04. වයස අවුරුදු 4-5 අවධියේ දරුවන්ගේ සමාජ සංවර්ධනයට බලපාන සාධක දෙකක් (02) දක්වන්න.

05. “වෛද්‍ය මාරියා මොන්ටිසෝරි ළමා කේන්ද්‍රීය අධ්‍යාපනය සඳහා දායක වන ලදී.“ ඇයගේ දායකත්වය පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

06. ශ්‍රී ලංකාවේ සිටින විවිධ අනතුරුදායක තත්ත්වයන්ට මුහුණ දෙන දරුවන් ලෙස ඔබ සලකන කණ්ඩායම් ලැයිස්තුගත කරන්න.

07. මුල් ළමාවියේ දී භාවිත වන රූසෝගේ “ ස්වභාවධර්මවාදී “ ඉගැන්වීම් ක්‍රමය පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

08. මුල් ළමාවියේ දී දරුවන් රූපවාහිනිය නැරඹීමෙහි බලපෑම් පහක් (05) ලැයිස්තු ගත කරන්න.

(ලකුණු 8 x 5 = 40)

## 2 වන කොටස

09. (i) "සමවයස් කණ්ඩායම් අතර අන්තර් ක්‍රියා දරුවන්ගේ සෞඛ්‍ය අධ්‍යාපනය හා සංවර්ධනයේ දී අත්‍යවශ්‍ය වේ."

සුදුසු උදාහරණ සහිතව ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) පෙරපාසල් දරුවන්ගේ සමවයස් අන්තර් ක්‍රියා සංවර්ධනය කිරීම සඳහා පෙර පාසල් ගුරුවරියක් විසින් සැලසුම් කල හැකි ක්‍රියාකාරකම් තුනක් (03) ලැයිස්තු ගත කර පැහැදිලි කරන්න. (ලකුණු 12)

10. (i) "පවුල "යන පදය නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ii) "විස්තෘත පවුල" හා "න්‍යෂ්ටික පවුල" යන සංකල්ප විස්තර කරන්න. (ලකුණු 06)

(iii) මුල් ළමා වියේ දරුවන්ගේ සමාජානුයෝජනය සඳහා පවුලේ භූමිකාව පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. "ඇතැම් දෙමව්පියන් තම දරුවන්ගේ ආරක්ෂාව හා රැකවරණය පිළිබඳ දක්වන සැලකිල්ල අඩු බවක් දක්නට ලැබේ."

(i) ඉහත ප්‍රකාශය හා ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුර සඳහා හේතු දක්වන්න. (ලකුණු 06)

(ii) ඉහත තත්වය කෙරෙහි බලපාන හේතු තුනක් (03) දක්වන්න. (ලකුණු 06)

(iii) එවැනි අවස්ථා මග හරවා ගැනීම පිණිස පෙර පාසල් ගුරුවරියට ගත හැකි ක්‍රියාමාර්ග මොනවා ද? (ලකුණු 08)

12. "බ්‍රිතාන්‍යයේ සිටින අවාසිදායක තත්වයන්ට මුහුණ දෙන දරුවන්ට ඇතිවන ගැටලු විසඳීම සඳහා හානිපූරක වැඩසටහනක් මගින් උත්සාහ දරා ඇත."

(i) හානිපූරක අධ්‍යාපනය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 05)

(ii) ශ්‍රී ලංකාවේ ජීවත්වන අවාසිදායක තත්ත්වයන්ට මුහුණ දෙන දරුවන් සඳහා එවැනි වැඩසටහන් යෝග්‍යයැයි ඔබ සිතන්නේ ද? ඔබගේ පිළිතුර සඳහා හේතු සපයන්න. (ලකුණු 10)

(iii) ශ්‍රී ලංකාවේ හානි පූරක අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ඇති වන බාධක මොනවා ද? (ලකුණු 05)

13. (i) ළමාවියේ දරුවන් සඳහා බලපාන විවිධ වර්ගයේ මාධ්‍යයන් හතරක් (04) නම් කරන්න. (ලකුණු 10)

(ii) ඔබ ඉහතින් දක්වන ලද මාධ්‍යයන්ගෙන් එකක් තෝරා ගන්න. එය දරුවන් කෙරේ ඇති කරන බලපෑම පහත අංශ ඔස්සේ විග්‍රහ කරන්න.

(a) ප්‍රජානන සංවර්ධනය

(b) චිත්තවේග සංවර්ධනය (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.